කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

(පැරණි නිර්දේශය)

2021 මාර්තු - 2022 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

සිංහල

**සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව SINH E – 2015**

**එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

I කොටස

01. පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා කතුවරයාගේ අවස්ථා නිරූපණ කුසලතාව අගයන්න.

කල් ගිය සේ තවත් බඩ දරු කෙනෙක් ඇති වූ ය. දෙවන වරෙහි ද වදන අවස්ථාවෙහි දී දෙමවුපියන් ළඟට කැඳවාගෙන යන්ට පැරැත්ත කියාපියා උන් නො ගිවිස්නා හෙයින් ආදි උපන් දරුවන් පයින් යන්ට අබල හෙයින් උනුත් වඩාගෙන බඩ දරුවනුත් බඩින් හැර ගෙන නික්මුණහ. සමුණන් ලුහුබඳවාගෙන ගොසින් රඳවන්ට උත්සාහ කොටගත් නොරඳා නික්මුණ වූය. සමුණෝත් කැටි ව නික්මුණවූය. මෙසේ එක් ව යන කලට නො කල් නො වේලා කොට ලා මහ වැස්සෙක් නැඟීය. ඒ වේලාට ගසන විදුලියෙන් හා මේඝනාදයෙන් හා වස්නා වැස්සෙන් ආකාශය අතුරු සිදුරු නැති විය. ඒ වේලාට ම පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ විළිත් පහරනට වන. ආස ගුගුරන්නා සේ හඬ ගසන්ටත් වන. වස්නා වැසි බෝවා සේ ම ප්‍රසව දුකුත් බෝ විය. සමුණන් බණවා ලා 'විළිත් පරනට වන. ශීත පීඩා බලවත් හෙයින් ඇල් වැද පියා විළිත් ලාගත නො හෙමි. නොතෙමී වදාපියන තැනක් ඉදිකරව' යි කිවූය.

02. පොළොන්නරු යුගයේ ගද්‍ය සාහිත්‍යයේ කැපී පෙනෙන ප්‍රවණතා පිළිබඳ විමසීමක් කරන්න.
නැතහොත්
විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණෙන් ඉස්මතු වී පෙනෙන භක්ති කාව්‍යය ලක්‍ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න.

03. <u>සද්ධර්මරත්නාවලී</u> කතාකලාවේ සුවිශේෂතා සනිදර්ශනාත්මක ව සාකච්ඡා කරන්න.

## II කොටස

04. බැද්දේගම නවකතාවේ චරිත නිරූපණයේ ප්‍රබලතා පිළිබඳ විමසීමක් කරන්න.

05. විලාසිනියකගේ ප්‍රේමය නවකතාවේ සාමාගේ චරිතයේ මනෝවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න.

06. පහත සඳහන් කෙටිකතා අතරින් එක් කතාවක් පිළිබඳ විචාරාත්මක ඇගයීමක් කරන්න.

අ. නෘත්‍යාගාරය
ආ. වැලිතලප
ඉ. නිවුණු තේ කෝප්පය
ඊ. රතු මැණික

## III කොටස

07. කෝලම් නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ මතවාද සමාලෝචනය කරන්න.

08. සිංහබාහු නාට්‍යයේ සුප්පා දේවියගේ චරිතය පිළිබඳ විමසීමක් කරන්න.

09. "අකිර කුරොසවගේ රෂෝමොන් ප්‍රේක්ෂක කුතුහලය උපරිමයෙන් රඳවා ගැනීමට සමත් සම්භාව්‍ය සිනමා කෘතියකි." සනිදර්ශනාත්මක ව සාකච්ඡා කරන්න.

10. "තුංමංහන්දිය සිංහල සිනමාවේ වැදගත් සන්ධිස්ථානයකි." මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව නිදසුන් ඇසුරෙන් විමසන්න.

*************************************